**ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතිය - 2014**

------------------------------------------------

ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස්එල්-පී 93 දරන ණය ගිවිසුම සහ ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2010 දෙසැම්බර් 16 දින එළඹි අංක එස්එල්-පී 93 දරන අතිරේක ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන විධායක නියෝජිතායතනය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ මහ කොළඹ ප්‍රදේශයේ දකුණු කොටසේ ජල සැපයුම් පහසුකම් ව්‍යාප්ත කිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම, කොළඹ නගරයේ කලාප IV ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම හා එමඟින් එම ප්‍රදේශවල ජීවන පරිසරය වැඩිදියුණු කිරීම සඳහා දායකවීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,330 කට සමාන ජපන් යෙන් මිලියන 10,846 ක් වන අතර, ඉන් රු.මිලියන 7,989 කට සමාන ජපන් යෙන් මිලියන 8,388 ක් හෙවත් සියයට 77.3 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල් ප්‍රමාණය රු. මිලියන 2,341 කට සමාන ජපන් යෙන් මිලියන 2,458 ක් හෙවත් සියයට 22.7 ක් ශ්‍රී ලංකා රජය දායක වීමට බලාපොරොත්තුවේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 මැයි 31 දක්වා දීර්ඝ කරන ලදි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය මුදල් වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2007 අගෝස්තු මස 07 වන දිනැති අංක MOFP/ERD/2007/2 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 21 වන දින ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් බාහිර සම්පත් දෙපාර්තමේන්තුවෙන් ගෙවන ලද රු. මිලියන 211.93 ක් සඳහා වූ බැදීම් සහ පොලී ගෙවීම් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සපයන ලද තොගයෙන් අඹතලේ වැඩබිම් කාර්යාලයේ ඉතිරිව තිබූ පිරිවැය රු. මිලියන 17.21 ක් වූ තොගය ව්‍යාපෘතියේ දේපළ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදනය සළසා නොතිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කරගැනීම සඳහා වැය කරන ලද රු.මිලියන 4.16 ක මුදල ඉඩම් හා ඉඩම් සංවර්ධනය යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස සළකා තිබුණි.

**2.2.3 නොසැසඳුණු ශේෂ**

සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනතුළ දක්වා තිබූ රු. මිලියන 8,618.17 ක කෙරීගෙන යන වැඩ වටිනාකම ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ වාර්තාවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ රු. මිලියන 8,647.50 ක අනුරූපී සංඛ්‍යාව සමග එකග නොවීය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | යෙන් මිලියන | රු.මිලියන | යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 8,388 | 7,989 | 1,500 | 1,499 | 1,831 | 5,924 | 8,076 |
| ශ්‍රීලංර | 2,458 | 2,341 | 295 | 258 | 298 | 1,256 | 1,613 |
| **එකතුව** | 10,846 | 10,330 | 1,795 | 1,757 | 2,129 | 7,180 | 9,689 |

**3.2 භෞතික කාර්යසාධනය**

ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය නැවත සැලසුම් කිරීමේ දී ව්‍යාපෘතිය නිමකිරීමේ කාලපරිච්ඡේදය 2017 මැයි 31 දක්වා දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති සාරාංශවලට අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව පැකේජ 19 ක් යටතේ ප්‍රදානය කර තිබුණ ද එම කොන්ත්‍රාත්තු අතුරින් පැකේජ 11 ක් සම්පූර්ණ කර තිබුණි. තවදුරටත් කොම්පඤ්ඤවීදිය හා උසාවි සංකීර්ණ ප්‍රදේශයන්හි පුනරුත්ථාපන සහ බෙදාහැරීම් පද්ධතිය නගා සිටුවීමේ කාර්යයන්හි සියයට 37 ක පමණ මන්දගාමී ප්‍රගතියක් වාර්තා විය. තවද නැගෙනහිර / බටහිර කැස්බෑවේ දීර්ඝ කරන ලද ප්‍රදේශ සඳහා නළ සපයා නොතිබීම සහ පිළියන්දල සහ කුඹුක ප්‍රාදේශීය ඉංජිනේරු නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් වැඩවල සියයට 64 ක් භෞතික ප්‍රගතියක් වර්ෂය අවසානයේදී නිරීක්ෂණය විය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 9 වන කොන්ත්‍රාත් පැකේජය යටතේ සිදුකිරීමට නියමිත මීටර් 84,039 ක නල මාර්ග කටයුතු වලින් මීටර 12,802 ක නල එලීමේ කටයුතු අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, මූලිකවම පයිප්ප එලීම සඳහා ඇස්තමේන්තු සකස් නොකරන ලද ප්‍රදේශ වන පානදුර හා කිරිබේරිය යන ප්‍රදේශයන්හි මූලිකව හඳුනානොගත් ප්‍රතිලාභීන් වන බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම මත අමතර නල මාර්ග මීටර 9,388 ක් එලීම සිදුකරන ලදී.

(ආ) ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් මූලික වියදම් සහ මිල ඉහළයාම හේතුවෙන් කොන්ත්‍රාත්තු 04 ක් සඳහා රු. මිලියන 108.15 ක අමතර වියදමක් දැරීමට සිදුවිය. ඊට අමතරව කොන්ත්‍රාත්කරුගේ වැඩ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් දකුණු කොළඹ ප්‍රදේශයේ බෙදාහැරීමේ නල මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා මූලික කටයුතු සහ මිල ඉහළ යාම් හේතුවෙන් රු. මිලියන 55.79 ක් අතිරේක පිරිවැයක් ව්‍යාපෘතියෙන් වැයකර තිබුණි. කෙසේ වෙතත්, 2014 දෙසැම්බර් 31 වන දින දක්වා කොන්ත්‍රාත්කරුගෙන් කිසිදු අලාභයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මතභේදාත්මක ස්වරූපයේ කරුණු**

**-------------------------------------**

ප්‍රායෝගික වශයෙන්, ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩලය සඳහා වන්දි ගෙවීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතරම, මෙම ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටියදී පොදු කාර්ය වියදම් ලෙස වැටුපෙන් සියයට 20 ක් ව්‍යාපෘතියෙන් දරනු ලබයි. ව්‍යාපෘතිය මගින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මෙතෙක් ගෙවා ඇති පොදු කාර්ය වියදම් රු. මිලියන 54.30 ක් විය.

**3.5 අතිවිශේෂ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හොරණ ප්‍රාදේශීය කාර්යාලය ලෙස භාවිතා කිරීම සඳහා ලබාගත් වසර 10 ක් බදු පදනම මත ගොඩනැගිල්ල වෙනුවෙන් ව්‍යාපෘතියකින් රු. මිලියනයක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් සඳහා ගෙවා ඇත. එයට අමතරව, ව්‍යාපෘතිය මගින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සහ නඩත්තු අංශයේ භාවිතා කිරීම සඳහා පිරිවැය රු. මිලියන 88.17 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ආ) කැස්බෑව හා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වෙසෙන පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වැය කරන ලද රු. මිලියන 5 සමාලෝචිත වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඇ) කිදෙල්පිටිය වැල්මිල්ලෙහි ඉදිකරනු ලැබූ උස් ජල කුළුනේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 394.46 සිට විෂය පථය වෙනස්වීම හේතුවෙන් රු.මිලියන 499.37 ක් දක්වා වැඩි වී ඇත. ඒ අතුරින් එහි ඇතුළත් වූ රු. මිලියන 71.91 ක වටිනාකමින් යුත් අතිරේක වැඩ ව්‍යාපෘතිය විසින් සැලසුම් කරන ලද ඉදිකිරීම සඳහා ඍජු සම්බන්ධතාවක් නොතිබුණි.

(ඈ) දියගම ක්‍රීඩා සංකීර්ණයේ සම්ප්‍රේෂණය සඳහා දරනු ලැබූ රු. මිලියන 32.64 ක මුදල ව්‍යාපෘතියේ අරමුණු, සාක්ෂාත් කරගැනීම සඳහා ඍජු සම්බන්ධතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

**3.6 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133 හා 2010 ජූලි 26 දිනැති අංක 5 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය සිදුකර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 756 හි නියමයන් පරිදි ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ව්‍යාපෘතිය මගින් ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 47.15 ක දේපළ සහ උපකරණ පිළිබඳ භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.